# කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

## 2026/2027 වර්ෂ සඳහා වාහන අලුත්වැඩියාව සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම.

**2026/2027 වර්ෂ සඳහා අමාත්‍යාංශයේ වාහන අලුත්වැඩියාවට සුදුසුකම්ලත් (කොළඹ අවට) සේවා සපයන්නන් ලියාපදිංචි කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**01. වාහන ආශ්‍රිත සේවා ලබා ගැනීම**

1.1. වාහන වාර සේවාවන් සිදු කිරීම

1.2. වාහන අලුත්වැඩියා කිරීම

- වාහනවල යාන්ත්‍රික අලුත්වැඩියාව
- වායු සමීකරණ අලුත්වැඩියාවන් සහ සේවාවන්
- වාහනවල විදුලි අලුත්වැඩියාව
- වාහන දිරා ඇති කොටස් අලුත්වැඩියා කිරීම සහ වර්ණ ගැන්වීම

1.3. වාහන කුෂන් කිරීම සහ කාපට් ඇතිරීම

**02. වාහන ආශ්‍රිත භාණ්ඩ මිලදී ගැනීම**

2.1 බැටරි, ටයර් සහ ටියුබ් සැපයීම

**කොන්දේසි**

01) අයදුම්පත් පහත ලිපිනයෙහි ඇති අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙතට පැමිණ හෝ www.industry.gov.lk යන අමාත්‍යාංශ වෙබ් අඩවියට පිවිස බාගත කර ගත හැකිය.

02) අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ලියාපදිංචි ගාස්තුව වශයෙන් (ආපසු නොගෙවනු ලබන) රු.1,000/-ක මුදලක් ගෙවීම් කිරීමෙන් අනතුරුව අදාල ගෙවීම සහතික කළ හැකි ලේඛනද සමඟ අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර මුදල් ගෙවීම පිළිබඳ නිසි තහවුරුවක් ඉදිරිපත් කර නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03) මේ සඳහා අමාත්‍යාංශයේ සරප් වෙතට පැමිණ අදාල මුදල ගෙවීම් කිරීමෙන් රිසිට්පත ලබා ගැනීම, මාර්ගගත ක්‍රමවේදය (online transfer) ඔස්සේ මුදල් ගෙවීම හෝ බැංකු තැන්පතුවක් (Bank Payment) මඟින් ගෙවීම් සිදු කළ හැකි අතර බැංකු ගිණුම් විස්තර පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| **ගිණුම් හිමියාගේ නම** | **: ලේකම්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය** |
| **බැංකු ගිණුම් අංකය** | **: 7040820** |
| **බැංකුව සහ ශාඛාවේ නම** | **: ලංකා බැංකුව, තැපොබේන් ශාඛාව** |
| **බැංකු කේතය** | **: 7010** |
| **ශාඛාවේ කේතය** | **: 747** |

04) අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරෙහි **"2026/2027 වර්ෂ සඳහා වාහන අලුත්වැඩියා කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

05) සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 මාර්තු මස 31දින ප.ව. 02.00ට හෝ ඊට පෙර සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, අංක 73/1, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

06) සැපයීම් සහ සේවා සඳහා අවම වශයෙන් දින 30ක ණය පහසුකම් සලසා දිය යුතුය.

07) නියමිත අවස්ථාවන්වලදී මිල ගණන් ඉදිරිපත් නොකරන හෝ නියමිත වේලාවට භාණ්ඩ නොසපයන හෝ මිල ගණන් ඉදිරිපත් කිරීමේදී කොන්දේසි නොපිළිපදින සේවා සම්පාදකයන්ගේ ලියාපදිංචි පූර්ව දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

08) නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් නොකරන අයදුම්පත් අයදුම්පත භාර ගැනීමේ/ප්‍රතික්ෂේප කිරීමේ බලය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සතුය.

09) ලියාපදිංචි කරන ලද අයදුම්කරුවන්ගේ ලැයිස්තුව 2026.04.20 දින සිට අමාත්‍යාංශ වෙබ් අඩවියේ පල කරනු ඇත.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.

විමසීම් 011-2347392 (ප්‍රසම්පාදන අංශය)

2026.03.08